ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2016 දෙසැම්බර් මස 09 වැනි දින** |

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නවවැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව

ශ්‍රී ලංකා මහ බැංකුවේ නවවැනි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2016 වසරේ දෙසැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද මෙම සමුළුව, මහ බැංකු, මුදල් අධිකාරීන්, විශ්වවිද්‍යාල සහ අනෙකුත් පර්යේෂණ ආයතනවල පර්යේෂකයන් හට මහ බැංකු කටයුතු සහ සාර්ව ආර්ථික කළමනාකරණය පිළිබඳ මෑතකාලීන සෛද්ධාන්තික සහ ප්‍රායෝගික පර්යේෂණ ඉදිරිපත් කිරීම සඳහා සංසදයක් සකස් කර දෙන අතර, කාලීන තේමා ඔස්සේ පර්යේෂණ සිදු කිරීම දිරිගැන්වීම අරමුණු කරන ලදී. 2008 වසරේ ආරම්භක සමුළුවේ සිට, ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව ලොව නන් දෙසින් විද්‍යාර්ථීන් ආකර්ෂණය කරනු ලබන සමුළුවක් වී ඇති අතර කීර්තිමත් මහ බැංකුකරුවන්, විද්වතුන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් එහි ප්‍රධාන දේශන පවත්වා ඇත.

මෙම වසරේ සමුළුව ‘අභියෝගාත්මක ගෝලීය සහ දේශීය වාතාවරණයක් තුළ තිරසාර සංවර්ධනය සහ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති’ යන පුළුල් තේමාව යටතේ පවත්වනු ලැබීය. මේ සඳහා විශ්වවිද්‍යාල, රාජ්‍ය ආයතන, ප්‍රතිපත්ති සම්පාදක මණ්ඩල සහ පර්යේෂණ ආයතන නියෝජනය කරමින් බොහෝ පිරිසක් සහභාගි විය.

මෙම සමුළුවෙහි ප්‍රධාන දේශනය, පසුගිය දශක කිහිපය තුළ ඉන්දියානු ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළ තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ ඉන්දියානු ජනරජයේ ක්‍රමසම්පාදන කොමිෂන් සභාවේ හිටපු නියෝජ්‍ය සභාපති ආචාර්ය මොන්ටෙක් සිං අළුවාලියා විසින් පවත්වනු ලැබීය. විශ්වසනීය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග තුළින් වෙළඳපොළ අපේක්ෂිත දිශාව වෙත මෙහෙයවීම සඳහා මහ බැංකුවලට ඇති හැකියාවෙහි වැදගත්කම ආචාර්ය අළුවාලියා සිය ප්‍රධාන දේශනයේ දී අවධාරණය කළ අතර, එහිදී ගුණාත්මක පර්යේෂණ වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව සඳහන් කළේය. එපමණක් නොව, නිසි මුදල් ප්‍රතිපත්ති උපකරණ සහ රාජ්‍ය මූල්‍ය මෙවලම් භාවිතා කරමින් ආර්ථිකයේ සමස්ත ඉල්ලුම පාලනය කිරීමට මහ බැංකුව සහ රාජ්‍ය මූල්‍ය අධිකාරිය විසින් ගනු ලබන සාමූහික ක්‍රියාමාර්ගයන්හි ඇති වැදගත්කම ඔහු පෙන්වා දෙන ලදී. ඒ අනුව, මහ බැංකුව සහ රාජ්‍ය මූල්‍ය අධිකාරියෙහි සාමූහික විශ්වසනීයත්වය මෙන්ම දේශපාලන ස්ථාවරත්වය රටක සාර්වආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීමට ඉතා වැදගත් කාර්යභාරයක් සිදු කරන බව ඔහු සඳහන් කළේය. මේ අතර, සාර්ව ආර්ථික ආකෘති නිර්මාණය පිළිබඳ අදහස් දක්වමින්, දියුණු වෙමින් පවතින රටවල ආයතනික සීමාවන් නිසි පරිදි විදහා දැක්වෙන ආකෘති නිර්මාණය සහ උචිත ආකෘති තෝරා ගැනීම, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සැකසීම සඳහා ආකෘති පදනම් කරගත් ආර්ථික උපදෙස් ලබා දීමේ දී තීරණාත්මක සාධක වන බව ආචාර්ය අළුවාලියා සඳහන් කළේය.

සමුළුවේ සමාරම්භක දේශනය ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් පවත්වන ලදී. තිරසාර සංවර්ධනය පිළිබඳව අදහස් දක්වමින්, සමාජ සංවර්ධනයට අතිරේකව ධනය ඉපදවීම සහ ඵලදායී රැකියා නිර්මාණය විය යුතු අතර, එහිදී ආර්ථික වර්ධනයෙහි ඇති ගුණාත්මක බව වැදගත් සාධකයක් බව ඔහු පැවසීය. අධ්‍යාපනය, පුහුණුව සහ නිපුණතා සංවර්ධනය මගින් පුද්ගල බලගැන්වීම ප්‍රධාන කරගත් සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනය, සමාජ ආරක්ෂණ ජාල, පාරිසරික තිරසාරත්වය, ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය සහ ප්‍රාදේශීය සමබරතාවය තිරසාර සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය බව අධිපතිතුමා සඳහන් කළේය. තවද, අභියෝගාත්මක ගෝලීය ආර්ථික වාතාවරණයක් තුළ, ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල් විචක්ෂණශීලී සාර්ව ආර්ථික කළමනාකරණය සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් අනුයුක්ත කිරීමට අවශ්‍ය බව අධිපතිතුමා අවධාරණය කළේය. මේ යටතේ, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පැහැදිලි සහ ස්ථාවර ප්‍රතිපත්ති රාමු නිර්මාණය කිරීම අත්‍යවශ්‍යව පවතී. එවැනි ප්‍රතිපත්ති රාමු ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ ක්‍රියාකාරකම් පුරෝකතනය කිරීමට ඇති හැකියාව සහ එම ක්‍රියාකාරකම්වල නිශ්චිතභාවය වැඩිදියුණු කිරීමට හේතු වනු ඇති අතර, එමගින් බාහිර කම්පනයන්ට ඔරොත්තු දීමට අවශ්‍ය අවකාශයන් ද නිර්මාණය කෙරේ.

ඇමරිකා එක්සත් ජනපදයේ, ශාන්ත තෝමස් විශ්වවිද්‍යාලයේ මූල්‍ය කටයුතු පිළිබඳ මහාචාර්යවරයෙකු ලෙස කටයුතු කරන මහාචාර්ය ලලිත් සමරකෝන් මහතා විසින් 'ශ්‍රී ලංකා මූල්‍ය වෙළඳපොළ සංවර්ධනය සඳහා සැලැස්මක්' යන මැයෙන් සමුළුවේ ආරාධිත දේශනය පවත්වන ලදී. ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීමේ සැලැස්මක් තුළ අන්තර්ගත කළ යුතු ප්‍රධාන අංශයන් මහාචාර්ය සමරකෝන් විසින් පෙන්වා දෙනු ලැබූ අතර, ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති හා යාන්ත්‍රණය, මූල්‍ය අංශය සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්ති හා යාන්ත්‍රණය සහ ජාතික මට්ටමේ ප්‍රතිපත්ති හා ඉහළ පෙළේ කැපවීම ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය සඳහා වන ජාතික වැඩසටහනක අත්‍යවශ්‍ය සාධක ත්‍රිත්වයක් ලෙස ඔහු විසින් හඳුන්වා දෙන ලදී.

මෙම සමුළුවේ තාක්ෂණික සැසිවල දී මුදල් ප්‍රතිපත්තිය, සාර්ව ආර්ථික ගැටලු සහ මූල්‍ය අංශයේ ගැටලු පිළිබඳව ප්‍රංශය, ජර්මනිය හා ඉන්දියාව යන රටවල විවිධ ආයතන නියෝජනය කරමින් පැමිණි පර්යේෂකයන් මෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවේ පර්යේෂකයන් විසින් තීව්‍ර ඇගයීමේ ක්‍රියාවලියක් තුළින් තෝරා ගනු ලැබූ පර්යේෂණ පත්‍රිකා අටක් ඉදිරිපත් කරන ලදී. පර්යේෂණවල විශිෂ්ඨත්වය ඇගයීමට ලක් කරමින්, හොඳම පර්යේෂණ පත්‍රිකාව සඳහා පිරිනමන ආචාර්ය ඩී. එස්. විජේසිංහ අනුස්මරණ සම්මානය ශ්‍රී ලංකා මහ බැංකුවේ ආචාර්ය සුජීතා ජෙගජීවන් මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද 'Understanding Sri Lankan Business Cycles through an Estimated DSGE Model' යන පර්යේෂණ පත්‍රිකාව සඳහා හිමි විය.

ශ්‍රී ලංකා මහ බැංකුව සිය මීළඟ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව 2017 වසරේ අවසානයේ දී පැවැත්වීමට අපේක්ෂා කරයි.

## ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ ඡායාරූප කිහිපයක්




***පසු පෙළ වමේ සිට:*** මහාචාර්ය ගුන්තර් රේමේ මහතා (ඩැම්ස්ටැඩ් තාක්ෂණ විද්‍යාලය), දීපක් කුමාර් බෙහෙරා මහතා (ඉන්දියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි මදුරාසිය), චරිත් ගමගේ මහතා (ශ්‍රී ලංකා මහ බැංකුව), ආචාර්ය සුජීතා ජෙගජීවන් මහත්මිය (ශ්‍රී ලංකා මහ බැංකුව), ආචාර්ය යනික් ලුකොට් මහතා (පීඑස්බී පැරිස් ස්කූල් ඔෆ් බිස්නස්), ආචාර්ය රාජ් රාජේශ් මහතා (ඉන්දියානු සංචිත බැංකුව), ආචාර්ය කිත්සිරි ඇහැලේපොළ මහතා (ශ්‍රී ලංකා මහ බැංකුව) සහ රුද්‍රා ප්‍රොසාද් රෝයි මහතා (ජඩාව්පූර් විශ්වවිද්‍යාලය)

***ඉදිරි පෙළ වමේ සිට:*** ආචාර්ය චන්ද්‍රනාත් අමරසේකර මහතා (අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ), ආචාර්ය යූතිකා ඉන්ද්‍රරත්න මහත්මිය (අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ සහ පර්යේෂණ උපදේශක කමිටු සභාපති), මහාචාර්ය ලලිත් සමරකෝන් මහතා (මූල්‍ය කටයුතු පිළිබඳ මහාචාර්ය, ශාන්ත තෝමස් විශ්ව විද්‍යාලය, එක්සත් ජනපදය), ආචාර්ය මොන්ටෙක් සිං අළුවාලියා මහතා (හිටපු නියෝජ්‍ය සභාපති, ඉන්දියානු ජනරජයේ ක්‍රමසම්පාදන කොමිසම), ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා (අධිපති), එස් ලංකාතිලක මහතා (නියෝජ්‍ය අධිපති), මහින්ද සිරිවර්ධන මහතා (සහකාර අධිපති/අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ) සහ ඩබ්ලිව් ඒ දිල්රුක්ෂිනී මහත්මිය (අතිරේක අධ්‍යක්ෂ, ආර්ථික පර්යේෂණ)



ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ සමාරම්භක සැසිය



ආචාර්ය මොන්ටෙක් සිං අළුවාලියා මහතා ප්‍රධාන දේශනය සිදු කරමින්




**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති, ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා සමාරම්භක දේශනය සිදු කරමින්**



**මහාචාර්ය සමරකෝන් මහතා ජාත්‍යන්තර පර්යේෂණ සමුළුම අමතමින්**